2023.01.08

## ගරු එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ 124 වන ජන්ම දින සැමරුම

1899 ජනවාරි මස 08 වන දින උපත ලද ගරු එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් 1926 වර්ෂයේ දී කොළඹ මහ නගර සභාවට තේරී පත්වීමෙන් සිය දේශපාලන ගමන ආරම්භ කළේය. ඔහු 1931 සිට 1947 දක්වා වසර 16 ක කාලයක් වේයන්ගොඩ අසුන නියෝජනය කර රාජ්‍ය මන්ත්‍රණ සභාව නියෝජනය කරමින් කටයුතු කළ කාල සීමාව තුළ එක් අවස්ථාවක පළාත් පාලන අමාත්‍යවරයා ලෙස කටයුතු කරන්නට යෙදුනි. ලංකාවේ ස්වයං පාලනයක් සම්බන්ධයෙන් දැඩි ස්ථාවරයක සිටි එතුමන් 1936 වර්ෂයේ දී සිංහල මහ සභාව ආරම්භ කරමින් අධිරාජ්‍යවාදයෙන් මුදා ගැනීම සඳහා ක්‍රියාකාරීව නායකත්වය ගෙන කටයුතු කරන ලදි.

1951 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවමින් ප්‍රගතිශීලී මතවාදය ඔස්සේ සිය දේශපාලන ගමන මෙහෙයවා 1956 වර්ෂයේ දී පැවති ධනපතිවාදී එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් කරමින් විශිෂ්ඨ ජයග්‍රහණයක් අත්කර ගැනීමට එතුමන්ට හැකියාව ලැබුණි. විශේෂයෙන් ම සඟ,වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගය පදනම් කර ගනිමින් ලබාගත් මෙම ජයග්‍රහණයෙන් පසු ලංකාවේ සිව්වන අග්‍රාමාත්‍යවරයා ලෙස වැඩ භාර ගෙන බස් රථ ජනසතු කිරීම, කුලය මත පදනම් ව ජනයා පීඩාවට පත් කිරීම තහනම් කර නීති සම්පාදනය කර එකල පැවති තදබල වැඩ වසම් සමාජ ක්‍රමයට දැඩි සේ විරෝධය දක්වමින් වාමාංශික ප්‍රතිසංස්කරණ හරහා ජනතාවට සමාන අයිතීන් ලබාදීමට නායකත්වය ගත්තේය.

එසේම ලංකාවේ පැවති බ්‍රිතාන්‍ය නාවික සහ ගුවන් කඳවුරු ඉවත් කර කොමියුනිස්ට් රාජ්‍යයන් ගණනාවක් සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පැවැත්වීමට එතුමා ක්‍රියා කළේය.

ලංකාවේ වාමාංශික මතවාද දරණ නායකත්වයන් ගණනාවක් සහ පක්ෂ ගණනාවක් පැවතිය ද එම වාමාංශික ප්‍රතිපත්ති සැබෑවටම ක්‍රියාත්මක කළ එකම නායකත්වය එස්.ඩබ්. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්වීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෙතෙක් පැමිණි අති දුෂ්කර ගමන් මාර්ගයට දැඩිසේ ඉවහල් වී ඇත. එතුමන් ජනිත කළ නව්‍ය අදහස් ගොනුකරගත් නායකත්වයන් ගණනාවක් පසු කළෙක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් රටට දායාද කළ අතර ඒ සඳහා එතුමන් ලබා දුන් අඩිතාලමේ ශක්තිමත්භාවය මත පදනම් වූ බව මා විශ්වාස කරමි.

කෙතරම් ජනහිතකාමී පාලනයක් ගෙන ගියද 1959 සැප්තැම්බර් 25 වන දින චීවරධාරියෙකුගේ වෙඩිපහරකට මුහුණ දී දැයෙන් සමුගත් එතුමන් ජනතාව වෙනුවෙන් දිවිදුන් ලෝක නායකයන් අතර ශ්‍රේෂ්ඨ නායකයෙක් ලෙස ඉතිහාසගත විය.

එතුමන් පෙන්වා දුන් මග ඔස්සේ යන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් කැපවී ක්‍රියා කරන, අවස්ථාවාදී නොවන ජන නායකත්ව ගණනාවක් පක්ෂය රැක ගැනීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා මේ වන විට උරදී ක්‍රියා කරන අතර එවන් නායකත්වයන් සමග බණ්ඩාරනායක ශ්‍රීමතාණන් ප්‍රාර්ථනා කළ, අපේක්ෂා කළ ප්‍රගතිශීලී පාලනයක් නොදුරේදීම උදාකර ගැනීම සඳහා අප සැවොම ක්‍රියාකිරීමට අදිටන් කර ගනිමු.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිනේවා...

නීතිඥ දයාසිරි ජයසේකර
ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන ලේකම්